කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්

சேயற்திறன் அறிக்கையும் வருடாந்த கணக்குகளும்

Performance Report & Annual Accounts

2013

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

பொது நிர்வாக மற்றும் உள்நாட்டலுவல்கள் அமைச்சு

Ministry of Public Administration & Home Affairs

කාර්යයසාධන වාර්තාව
සහ වාර්ෂික ගිණුම්

2013

රාජ්‍ය පරිපාලන
සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

දුරකථන : 011-2696211-3
ෆැක්ස් : 011-2695279

ඊ - මේල් : infor@pubad.gov.lk

අන්තර්ජාල ලිපිනය : www. pubad.gov.lk

<u>හැඳින්වීම</u>

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හා 2002.06.12 හි

2. 4 ඡේදය පරිදි පිළියෙල කළ

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාශයේ

2013 වර්ෂයට අදාල *වාර්ෂික කාර්යසාධන හා ගිණුම් වාර්තාව*

මේ සමඟ ඉදිරිපත් කරමි.

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

හා අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව , රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 හි

මූල්‍ය හා මූල්‍ය නොවන

දත්ත ඇතුළුව අමාත්‍යාංශයේ මෙහෙයුම් සැලැස්ම සමඟ සංසන්දනාත්මකව

කාර්ය සාධනය

පිළිබිඹු වන පරිදි මෙම වාර්තාව සකස්කර ඇත.

ලේකම්,

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

පෙළගැස්ම

		පිටු අංක
1	ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය	1
2	ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය	2
3	ගරු ලේකම් තුමාගේ පණිවුඩය	3
4	හැඳින්වීම	4
5	දැක්ම	4
6	මෙහෙවර	4
7	අරමුණු	5
8	උපාය මාර්ග	5
9	කාර්යයන්	6
10	සංවිධාන ව්‍යුහය	8
11	අනුමත කාර්යය මණ්ඩලය - **2013**	09 - 10
12	අංශ හැඳින්වීම	11 - 14
13	ප්‍රධානඉලක්ක ලගාකර ගැනීම් - 2013	15 - 20
14	දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල තොරතුරු	24 - 31
15	කාර්යයසාධනය– 2013	32 - 73
	❖ රාජ්‍ය පරිපාලන අංශය	33 - 42
	❖ ස්වදේශ කටයුතු අංශය	43 - 49
	❖ අභ්‍යන්තර පාලන සහ පරිපාලනප්‍රතිසංස්කරණ අංශය	51 - 60
	❖ වෙනත්අංශ	61 - 70
	❖ සේවා අංශ	71 - 73
16	වාර්ෂික ගිණුම් වාර්තා - 2013	74 - 85
17	දිස්ත්‍රික් කාර්යාල වල වියදම් ප්‍රගතිය	86 - 94

ජනතා අපේක්ෂා ඉටුවන කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සඳහා.....

"සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතියකින් රාජ්‍ය සේවය දෙස බලන විට මා හැම විටම විශ්වාස කරන්නේ රාජ්‍ය සේවය හැම අතින්ම සේවා ලාභියාගේ පහසුව පිණිස ක්‍රියාත්මක විය යුතු බවයි", ඒ අතිගරු ජනාධිපතිතුමන් රාජ්‍ය සේවය තුළින් අපේක්ෂා කරන ඉලක්කයයි. මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව රාජ්‍ය සේවයේ ඉලක්ක සහ අරමුණු කරා ළඟාවෙමින් සුවහසක් ජනතාවගේ අපේක්ෂා මුදුන්පත් කරලීම උදෙසා රාජ්‍ය සේවකයාගේ මහගෙදර, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය නොනිමි මෙහෙවරක නිරතව සිටින බව ප්‍රකාශ කරන්නේ මහත් වූ අභිමානයෙනි.

ගතවූ වසර කිහිපය තුළ රාජ්‍ය සේවයේ විශාල ප්‍රගමනයක් අත්කරගැනිමට අපට හැකිවිය. තිස් වසරක කුරිරු යුද්ධයෙන් අකර්මන්‍ය වූ උතුරු නැගෙනහිර පළාත්හි නැවත සිවිල් පරිපාලනය ස්ථාපිත කරමින්, විධිමත් රාජ්‍ය සේවයක් මහජනතාවට ලබාදිමට පියවර රැසක් ගැනීමට හැකිවීම අපි ලැබූ විශාලතම ජයග්‍රහණයකි. එයින් නොනැවති දිවයිනේ 332 ක් වූ ප්‍රදේශිය ලේකම් කාර්යාල සියල්ලටම අවශ්‍ය භෞතික හා මානව සම්පත් ලබාදෙමින් ජනතා සේවය වඩාත් කාර්යක්ෂමව සිදු කිරිමට අවශ්‍ය පියවරගෙන ඇත . ජනතා සේවාවන් කාර්යක්ෂමවත්, ඵලදායිවත් ඉටුකරදීමේ අරමුණින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල නව පරිපාලන සංකිර්ණ බවට පරිවර්තනය කිරීමට අපට හැකිවිය. මේ වන විට හම්බන්තොට, මාතර, කොළඹ ආදි දිස්ත්‍රික්ක ගණනාවක නව පරිපාලන ගොඩනැගිල්ලි ස්ථාපිත කරමින් මහජනතාවට සමීප රාජ්‍ය සේවයක් ලබාදිමට අවශ්‍ය අඩිතාලම දමා ඇත.

ගුණාත්මක සඵලදායි රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම උදෙසා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය අපි නොබියව භාවිත කළෙමු. ඉ- තාක්ෂණය නූතන ලෝකයේ රාජ්‍ය පරිපාලනයේ හැරවුම් ලක්ෂය බවට පත්ව ඇත. ඒ අනුව "ඉ - තාක්ෂණය" නගරයේ සිට ග්‍රාමීය තලය දක්වා ව්‍යාප්ත කරමින් නව තාක්ෂණයෙන් සන්නද්ධ කඩිනම් රාජ්‍ය සේවයකට අවැසි පරිසරයක් ගොඩනැගුවෙමු. රාජ්‍ය සේවයේ දී ඇතිවන සන්නිවේදන බාධාවන් මඟහැරිම උදෙසාත්, රාජ්‍ය නිලධාරීන් අතර සන්නිවේදනය කඩිනම් කිරිම සඳහාත් මේ වන විට අමාත්‍යාංශය මගින් කෙටි පණිවිඩ සේවා ක්‍රමයක් ආරම්භ කරමින් අමාත්‍යාංශ මට්ටමේ සිට ග්‍රාමිය මට්ටම දක්වා රාජ්‍ය නිලධාරියාගේ සන්නිවේදන සම්බන්ධතා පුළුල් කිරිමට පියවර ගන්නා ලදී.

ශක්තිමත් රාජ්‍ය සේවයක් තුළින් ජනතා අවශ්‍යතා ඉටු කිරීමේ අරමුණින් රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් වර්ධනය කිරිමට පසුගිය කාලය තුළ අපි සමත් වුණෙමු. උපාධිධරීන් 51,000ක් බඳවා ගැනීමේ අභියෝගය ද සාර්ථක සිදු කිරීම කාගේත් ප්‍රශංසාවට ලක්විය. ඒ අනුව රටේ බුද්ධිමත් තරුණ පිරිස් රාජ්‍ය සේවයට එක් කරගැනීම රටේ අනාගතය වෙනුවෙන් කළ කදිම ආයෝජනයකි. මීට අමතරව පසු ගිය වකවානුව තුළ පරිපාලන සේවය, රාජ්‍ය කළමණාකරන සේවය, ග්‍රාම නිලධාරි සේවය, ඇතුළු රාජ්‍ය සේවයේ තනතුරු රැසක් සඳහා 10,000 කට ආසන්න පිරිසක් බඳවාගනිමින් රාජ්‍ය සේවයේ සීමා මායිම් අතික්‍රමණය කිරිමට අපට හැකිවිය.

රාජ්‍ය සේවයේ පැවති විවිධ අභියෝග ජයගනිමින් අධිෂ්ඨානශීලීව, දැඩි කැපවීමෙන් හා උනන්දුවෙන් කටයුතු කරමින් නිරන්තරයෙන් මා හට සහාය දුන් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ලේකම්තුමා ප්‍රධාන සියලුම කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාව පළ කරන අතර "සේවයට කැපවෙමු - පුරවැසි අයිතීන් සුරකිමු" යන අප අමාත්‍යාංශ තේමාව යථාර්තයක් බවට පත්කරගැනිමට අවශ්‍ය සක්‍රීය දායකත්වය ඉදිරියේදිත් ඔබ සැමගෙන් නො අඩුව ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමි.

ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න

(පාර්ලිමේන්තු මන්ත්‍රී)

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය

ජනහිතකාමී රාජ්‍ය සේවාවක් උදෙසා කැපවෙමු.....

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් සහාගත කරනු ලබන 2013 වසරේ ප්‍රගති වාර්තාව සඳහා රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් මෙම සටහන තබනුයේ අතිශය ප්‍රීතියෙනි.

ගරු රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යතුමාට මාගේ පූර්ණ සහයෝගය ලබාදෙමින් හා එතුමාගේ මඟ පෙන්වීම යටතේ උපරිම කාර්යක්ෂමතාවයෙන් යුත් ගුණාත්මක රාජ්‍ය සේවාවක් ගොඩනැංවීම සඳහා වන ප්‍රයත්නයට මාගේ පූර්ණ දායකත්වය ලබාදීමට කැපවී සිටින බව සඳහන් කරනු කැමැත්තෙමි.

2013 වර්ෂයේ අමාත්‍යාංශයේ වැදගත්ම සංධිස්ථානයක් වූ අමාත්‍යාංශීය ප්‍රගති සමාලෝචන සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ සම්ප්‍රාප්තියෙන් එහිදී අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් සහ විශිෂ්ඨ රාජ්‍ය සේවයක් සඳහා වූ කරුණු කාරණා ඉදිරිපත් වූ අතර එම කරුණු කාරණා ක්‍රියා මාර්ගයට ගෙන විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීම අප සැමගේ වගකීම වන්නේය.

අප අමාත්‍යාශයේ ප්‍රධාන දැක්ම වන්නේ " ජනතාව සඳහා විශිෂ්ඨ රාජ්‍ය සේවාවක්" යන්නයි. එම තේමාව මූලික කරගෙන, දශක තුනක කුරිරු යුද්ධයේ නිමාව සමඟම අරුණළු නැගෙනා උතුරු නැගෙනහිර මහජනයා හට කාර්යක්ෂම වූ විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් ලබාදීමට අපි කැපවී සිටින්නෙමු. ඒ වෙනුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් වල නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිලි විවෘත කරමින්ද, එම පළාත් වල මහජන සේවය සඳහා ග්‍රාම නිලධාරීන් කළමනාකාර සහකාරවරුන් බඳවාගැනීමේ කටයුතු විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීම තුලින්ද එය මනාව පිළිබිඹු වේ.

2013 වර්ෂයේ දී රාජ්‍ය කළමනාකාර සහකාර නිලධාරීන් 2798 ක් හා, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් 112 ක්, බඳවාගෙන ඇති අතර ග්‍රාම සේවක නිලධාරීන් 4045 ක් සඳහා බඳවා ගැනීම් කටයුතු අවසන් කිරීම තුලින් ශ්‍රී ලාංකීය තරුණ පරපුර සඳහා දොරගුළු විවෘත වීම අප ලැබූ ජයග්‍රහණයකි.

අවසාන වශයෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිදුන්ගේ "මහින්ද චින්තන ඉදිරි දැක්ම" වැඩ පිළිවෙල යටතේ සුවිශේෂී කාර්යය භාර්යයක් ඉටුකිරීමට මාර්ගෝපදේශකත්වය සපයන රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්.ඩී.ජේ.සෙනවිරත්න මැතිතුමන්ට මෙන්ම අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලය ද දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා එම කාර්යය මණ්ඩලයේ සියළුම නිලධාරීවරුන්ටද මාගේ ස්තුතිය පුදකර සිටිමි.

ඩී.ඩබ්ලිව්.ඩබ්ලිව්. දහනායක
(පාර්ලිමේන්තු මන්ත්‍රී)
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

තිරසාර සංවර්ධනයක් උදෙසා රාජ්‍ය සේවයක්.....

ශ්‍රී ලංකාවේ පරිපාලනය සම්බන්ධයෙන්,දීප ව්‍යාප්තව විසුරුණු ජාලමය එකමුතුවක් සහිත වූ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ නායකත්වය හොබවමින්,ශ්‍රී ලංකාවේ පරිපාලනයේ පුනර්ජීවයක් ඇති කරමින් සංවර්ධනය කරා යන ගමනේ වගකිව යුතු කොටස් කරුවෙකු වීම මා ලැබූ භාග්‍යයකි.එසේම මෙම අමාත්‍යාංශය 2013 වසර තුළ මහජනතාව උදෙසා ඉටු කරන ලද මෙහෙවර ඇතුළත් කරන ලද වාර්ෂික ප්‍රගති වාර්තාව - 2013 වෙත පණිවිඩයක් නිකුත් කරන්නේ ඉමහත් සතුටිනි.

ජාතියට විශිෂ්ට රාජ්‍ය සේවාවක් ලබා දීම අපගේ දැක්ම කර ගනිමින්,නිපුණ මානව සම්පත් සපිරි යහපත් ජාතික සහ ප්‍රාදේශීය පාලන පද්ධතියක් තුළින් විශිෂ්ඨ සේවාවක් සහතික කිරීම රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ මෙහෙවර වේ.

රාජ්‍ය පරිපාලන අංශය,ස්වදේශ කටයුතු අංශය ප්‍රධානව අභ්‍යන්තර පාලන අංශය,විමර්ශන හා මෙහෙයුම් අංශය,ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා අංශය,ශ්‍රී ලංකා විද්‍යාත්මක ,වාස්තු විද්‍යා හා තාක්ෂණික සේවා අංශය,විශ්‍රාම වැටුප් හා නිවාස අංශය යන සියලුම අංශයන් ඔස්සේ,සමස්ත ශ්‍රී ලාංකේය මහජනතාවටම විශිෂ්ඨ යහපත් වූ සේවාවක් සැපයීමට මෙම අමාත්‍යාංශය කටයුතු කරමින් සිටී.එසේම අප අමාත්‍යාංශයට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව හා සංවර්ධන පරිපාලන ආයතනය ද මහජනතාවගේ අපේක්ෂාවන් මල්ඵල ගැන්වීමේ අරමුණු පෙරදැරිව සිය සේවා සැපයීම් සිදු කරයි. දීප ව්‍යාප්ත දිස්ත්‍රික් හා පරිපාලන ඒකකයන්ගෙන් සමන්විත ශ්‍රී ලංකාව පුරා විසිරුණු පරිපාලනමය හා සංවර්ධන යාන්ත්‍රණයන් නවීන තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් හි උපයෝගිතාවය තුළ ඒකාබද්ධ කරමින් නගරයේ සිට ඈත ගම් දනව් දක්වා සිටින මහජනතාව වෙත සමාන හා සාධාරණත්වයෙන් යුතු සේවා සැපයීමක් කිරීමට අප අමාත්‍යාංශය සමත්ව ඇත.

රාජ්‍ය සේවයේ කාර්යක්ෂම මානව සම්පත් කළමනාකරණය සඳහා විචක්ෂණ ප්‍රතිපත්තියක් සහ නියාමන රාමුවක් අනුගමනය කරමින්,රාජ්‍ය සේවා සැපයීමේදී ඵලදායිතාවය ඉහළ නැංවීම උදෙසා ම වූ ක්‍රියාදාම හා සංවර්ධනය සඳහා වන පරිපාලන ප්‍රතිසංස්කරණයක් කරමින්,රාජ්‍ය සේවය ජනතාවට හිතවාදී වූ සුවිශිශ්ඨ රාජ්‍ය සේවාවක් ඇති කරමින් **ශ්‍රී ලංකාව** නම් ලෝකයේම නෙත් යොමු වූ ඉන්දියන් සාගරයේ "මුතු ඇටය" ආසියාවේ ආශ්චර්ය කරා ගෙන යන්නට "මහින්ද චින්තනය" නියමු ප්‍රතිපත්තිය කර ගනිමින් සුවහසක් ජනතාවට අප අමාත්‍යාංශයේ වගකීම් නොපිරිහෙලා ඉටු කිරීමට අප නිරන්තරයෙන් බැඳි සිටිමු.ඒ සඳහා ඔබගේ උපරිම දිරිය උත්සහය ලබා දෙනු ඇතැයි උදක්ම අපේක්ෂා කරමි.

මෙම සත්කාරයේදී රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය ඩබ්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමා හා ගරු නියෝජ්‍ය අමාත්‍ය ඩී.ඩබ්.ඩබ්.විජය දහනායක මැතිතුමා ලබා දෙන නායකත්වය කෘතඥ පූර්වකව සිහිපත් කරමි.එසේම සුවිශිෂ්ඨ රාජ්‍ය සේවාවක් උදෙසා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මත 2013 වසරේදී පැවරුණු වගකීම් සහ ඉලක්කයන් උපරිම අයුරින් සාක්ෂාත් කර ගැනීමට දායකත්වය දුන් ඔබ සැමට හෘදයාංගවම ස්තූති කරමින් 2014 දී ද ඔබ සැමගේ උපරිම දායකත්වය අපේක්ෂා කරමි.

පී.බී.අබේකෝන්

ලේකම්.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

හැඳින්වීම

සිවිල් පරිපාලනයේ කේන්ද්‍රස්ථානය වශයෙන් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් රාජ්‍ය පරිපාලනය, දිස්ත්‍රික් පරිපාලනය, ප්‍රාදේශීය පරිපාලනය, ග්‍රාම පරිපාලනය, සිවිල් ලියාපදිංචි කිරීම් සහ සේවක සුබසාධනය ආශ්‍රිත සේවාවන් සඳහා පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය ඉටු කරයි. ඒ අනුව, රජයේ ජාතික ප්‍රමුඛතාවයන් හා සමගාමීව සමාජ හා ආර්ථික සංවර්ධනය ඉලක්ක කරගනිමින් සංවිධානමය සුවිශිෂ්ටත්වය උදෙසා වන රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, මානව සම්පත් කළමනාකරණය, ආයතනික සංවර්ධනය, විද්‍යුත් රාජ්‍ය පාලනය සහ යහ පාලනය වැනි ක්ෂේත්‍ර ගණනාවක් සමග අමාත්‍යාංශය කටයුතු කරයි. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ උපාය මාර්ගික රාමුව පහත පරිදි වේ.

දැක්ම

ජාතියේ උන්නතිය උදෙසා වන සුවිශිෂ්ට රාජ්‍ය සේවාවක්

මෙහෙවර

නිපුනතාවයෙන් හෙබි මානව සම්පත් උපයෝජනය සහිත ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ ප්‍රශස්ථ පරිපාලන ක්‍රමයක් තුළින් සුවිශිෂ්ට රාජ්‍ය සේවාවක් තහවුරු කිරීම

අරමුණු

1. කාර්යක්ෂම, ඵලදායී, හැකියාවෙන් කුසලතාවයෙන් පිරිපුන් මානව සම්පත් කාලීනව සැපයීම සහතික කිරීම සහ විෂයානුබද්ධ හා තාක්ෂණික කුසලතා හා හැකියාවන් සහිත රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම.

2. රාජ්‍ය සේවය සඳහා සරල සංවර්ධනාත්මක යොමුවක් සහිත රාජ්‍ය කළමණාකරණ ප්‍රතිපත්ති ප්‍රති නිර්මාණය හා කළමනාකරණය.

3. රාජ්‍ය සේවාවේ යහ පාලන මූලධර්ම පාදක කර ගත් රාජ්‍ය පරිපාලන යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

4. ජනතාවට වඩා සමීප වූ සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයක් සහිත විමධ්‍යගත පරිපාලන යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

5. රාජ්‍ය සේවා සැපයීමේදී නවීණ තොරතුරු තාක්ෂණ සහසම්බන්ධතාව ශක්තිමත් කරමින් මහජන සේවාවන් පහසුකරණය සහ සරල කිරීම.

6. රාජ්‍ය සේවකයන්ගේ හා විශ්‍රාමික ප්‍රජාවගේ යහ පැවැත්ම සහ සුභසාධනය ඉහල නැංවීම.

7. වත්කම් කළමනාකරණය ඇතුළුව සිවිල් පරිපාලන පද්ධතියේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම.

8. ප්‍රතිඵල ඉලක්ක කර ගත් කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවා සංස්කෘතියක් වෙත ප්‍රවේශය ලබා දීම.

9. ජාතික සංවර්ධනයේදී පෞද්ගලික අංශයේත්, සමස්ත රාජ්‍ය අංශයේත් සහභාගීත්වය තහවුරු කරමින් සංවර්ධන යන්ත්‍රණයේදී නියමුවා බවට රාජ්‍ය යන්ත්‍රණය පත් කිරීම.

මූලික කාර්ය සාධන දර්ශක (KPI)

- ❖ මානව සම්පත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය.
- ❖ අදාල නිලධාරී කණ්ඩායම් පුහුණු කිරීම සඳහා වැය කළ වාර්ෂික පුහුණු පැය ගණන.
- ❖ රජයේ සේවාවන්ට අදාලව චක්‍රලේඛ /උපදෙස් / ප්‍රතිපත්ති නිර්වචනය කිරීම් සංඛ්‍යාව.
- ❖ දිස්ත්‍රික්/ප්‍රාදේශීය පරිපාලනයට අදාලව මහජන පැමිණිලි/ ඉල්ලීම් සඳහා විසඳීම් ලබාදීමේ ප්‍රතිශතය.
- ❖ උපත්/විවාහ/මරණ ආදී ලේඛන නිකුත් කිරීම සඳහා ගතවන කාලයෙහි සාමාන්‍ය.
- ❖ විශ්‍රාම යන අවස්ථාවේම පාරිතෝෂික ගෙවනු ලැබූ විශ්‍රාමික ප්‍රතිශතය.

උපාය මාර්ග

- ❖ රාජ්‍ය සේවයේ කාර්යක්ෂම මානව සම්පත් කලමනාකරණ පද්ධතියක් උදෙසා වන විචක්ෂණශීලී ප්‍රතිපත්ති සහ නියාමන රාමුවක් සැකසීම.
- ❖ රාජ්‍ය සේවා සම්පාදනයේ ඵලදායකත්වය අභිවර්ධනය උදෙසා ක්‍රියාවලීන් ප්‍රතිජනනය සහ පද්ධති සංවර්ධනය කරා යොමු වූ පරිපාලන ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම.
- ❖ රාජ්‍ය සේවය තුළ තරඟකාරී බඳවාගැනීම් සහ තෝරාගැනීම් ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම.
- ❖ ඉල්ලුමට ප්‍රතිචාරික ධාරිතා සංවර්ධනය සහ අනුරූපී නිපුණතා සංවර්ධනය.
- ❖ පුරවැසියන් හට සමීප සේවා සම්පාදනයක් උදෙසා විමධ්‍යගත ආයතනික ජාලයක් ස්ථාපිත කිරීම.
- ❖ සිවිල් ලියාපදිංචි කිරීමේ විමධ්‍යගත ජාලයක් සහ ස්වයංක්‍රීය/විචක්ෂණශීලි ලේඛන කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම
- ❖ රාජ්‍ය සේවයේ ගුණාත්මක අභිවර්ධනය සහ විනිවිද පෙනෙනා සේවා සම්පාදනයක් උදෙසා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම
- ❖ පුරවැසි කේන්ද්‍රීය රාජ්‍ය සේවාවක් කරා යොමු වූ සේවා සම්පාදනය ප්‍රමිතිගත කිරීම උදෙසා පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කිරීම.

<u>කාර්යයන්</u>

කළමනාකරණය

01. රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු විෂයය පථයට අදාළව ප්‍රතිපත්ති සැළසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

02. ඒකාබද්ධ සේවා, ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයට අදාළ සේවාවන් කළමනාකරණය කිරීම.

03. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයද ඇතුළුව අමාත්‍යාංශයේ විෂයය පථය යටතට ගැනෙනා සියළු නියෝජිතායතන වල කළමනාකරණය, අධීක්ෂණය සහ සම්බන්ධීකරණය පවත්වා ගැනීම.

04. රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතට ගැනෙනා සියළු නියෝජිතායතන වලට අවශ්‍ය මූල්‍ය සහ පරිපාලන උපකාරී සේවා සම්පාදනය කිරීම.

05. රාජ්‍ය සේවාවේ මානව සම්පත් සංවර්ධනය

06. රාජ්‍ය සේවයේ ධාරිතා වර්ධනය සඳහා අවශ්‍ය වැඩපිළිවෙලවල් සැකසීම

07. පරිපාලන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති සම්පාදනයේ ලා සහාය වීම සහ ඒවා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතට ගැනෙනා ආයතන තුළ ක්‍රියාවේ යෙදවීම.

08. නව්‍ය රාජ්‍ය කළමනාකරණ සංකල්ප අත්හදාබැලීම, ප්‍රායෝගිකව ක්‍රියාවේ යෙදවීම හා භාවිතා කිරීම.

ව්‍යවස්ථාපිත

01. රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයන් සහ රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල හා සම්බන්ධ ප්‍රතිපත්තීන් සම්පාදනය හා ක්‍රියාවට නැංවීම

02. ආයතන සංග්‍රහයේ විධිවිධාන සම්පාදනය, නිර්වචනය සහ සංශෝධන කිරීම

03. ජාතික නිදහස් දින උළෙල හා අනෙකුත් උත්සව සංවිධානය කිරීම

04. නිවාඩු දින පනත ක්‍රියාවට නැංවීම

05. සිවිල් ලියාපදිංචි කිරීමේ කටයුතු වලට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම

රාජ්‍ය සේවයකයන්ගේ සමාජ සුබසාධනය

01. රාජ්‍ය සේවකයන් උදෙසා වන සමාජ ආරක්ෂණ වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම (අග්‍රහාර රක්ෂණ ක්‍රමය, දේපළ ණය යනාදිය)

02. රාජ්‍ය සේවකයන් උදෙසා නිවාස පහසුකම් සැපයීම සහ රජයේ නිල නිවාස වෙන්කිරීම

03. රාජ්‍ය සේවකයන් උදෙසා නිවාඩු බංගලා හා සංචාරක බංගලා කළමනාකරණය කිරීම සහ විශ්‍රාමික නිවාඩු නිකේතනය කළමනාකරණය කිරීම

04. නිල ප්‍රවාහන පහසුකම් සැපයීම

සංවිධානය

- **රාජ්‍ය පරිපාලනය**
    - ආයතන අංශය
    - ඒකාබද්ධ සේවා අංශය
    - විශ්‍රාම වැටුප් සහ නිවාස අංශය
    - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
    - පර්යේෂණ හා සංවර්ධන අංශය

- **ස්වදේශ කටයුතු**
    - දිස්ත්‍රික් පාලන අංශය
    - ප්‍රාදේශීය පාලන අංශය
    - ග්‍රාම නිලධාරී පාලන අංශය
    - රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව

- **අභ්‍යන්තර පාලන සහ පරිපාලන ප්‍රතිසංස්කරණ**
    - අභ්‍යන්තර පාලන අංශය
    - පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය
    - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

- **මූල්‍ය අංශය**
    - මූල්‍ය වාර්තාකරණ අංශය
    - ගෙවීම් අංශය
    - දිස්ත්‍රික් ගිණුම් අංශය
    - ප්‍රසම්පාදන අංශය

- **අනෙකුත් අංශ**
    - අභ්‍යන්තර විගණන අංශය
    - විමර්ශන අංශය
    - මාධ්‍ය අංශය

- **සේවා අංශ**
    - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා අංශය
    - ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා අංශය
    - ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා අංශය
    - ශ්‍රී ලංකා තාක්ෂණ සේවා අංශය

සංවිධාන සටහන
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.



රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

අනුමත කාර්යය මණ්ඩලය (2013/12/31 දිනට)

තනතුරේ ස්වභාවය	තනතුර	අදාල වන සේවය	ශ්‍රේණිය	අනුමත මුළු තනතුරු සංඛ්‍යාව	සේවයේ නියුතු සංඛ්‍යාව	පුරප්පාඩු/ අතිරික්ත තනතුරු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	ලේකම්	_	_	1	1	0
	අතිරේක ලේකම්	ශ්‍රී. ලං.ප. සේවය	විශේෂ ශ්‍රේණිය	4	4	0
	අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී. ලං.ප. සේවය	විශේෂ ශ්‍රේණිය	2	2	0
	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	ශ්‍රී. ලං.ප. සේවය	1 පන්තිය	8	7	1
	අධ්‍යක්ෂක	ශ්‍රී. ලං.ප. සේවය	1 පන්තිය	9	9	0
	ප්‍රධාන මූල්‍ය නිළධාරි	ශ්‍රී. ලං.ග. සේවය	විශේෂ ශ්‍රේණිය	1	0	1
	ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී. ලං.ග. සේවය	1 පන්තිය	1	1	0
	ප්‍රධාන අභ්‍යන්තර විගණක	ශ්‍රී. ලං.ග. සේවය	1 පන්තිය	1	1	0
	ගණකාධිකාරී	ශ්‍රී. ලං.ග. සේවය	11-1/11-11 පන්තිය	3	4	-1
	සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂක	ශ්‍රී. ලං.ප. සේවය	11/111 පන්තිය	23	18	5
	සහකාර ලේකම්	ශ්‍රී. ලං.ප. සේවය	111 පන්තිය	11	9	2
	සහකාර ලේකම්	ශ්‍රී. ලං.ක්‍රැ. සේවය	111 පන්තිය	1	1	0
	සහකාර අධ්‍යක්ෂක	ශ්‍රී. ලං.තො.තා.සං.සේවය	1 පන්තිය - 111 ශ්‍රේණිය (11/1)	2	1	1
	ප්‍රධාන ඉංජිනේරු	ශ්‍රී. ලං.ඉං. සේවය	1 පන්තිය	1	0	1
	ඉංජිනේරු	ශ්‍රී. ලං.ඉං. සේවය	11/111 පන්තිය	2	2	0
	සහකාර ලේකම් (වෘත්තීය සමිති)	_	_	1	1	0
	නීති නිළධාරී	දෙපාර්තමේන්තු ගත තනතුරු	_	1	0	1
	සහකාර අධ්‍යක්ෂක(ප්‍රවෘත්ති)	_	_	1	1	0
	උපදේශක	_	_	1	1	0
	එකතුව			74	63	11
තෘතීක මට්ටම	පරිපාලන නිළධාරී	රා.ක.ස.සේවය	අධි පන්තිය	8	5	3
	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිළධාරි -11	ශ්‍රී. ලං.තො.තා.සං.සේවය	11 පන්තිය - 11 ශ්‍රේණිය(1)	3	2	1
	භාෂා පරිවර්තක	භාෂා පරිවර්තක සේවය	-	7	7	0
	එකතුව			18	14	4
ද්විතීක මට්ටම	සැපයුම් සහකාර	ආශ්‍රිත සෙවා	-	2	1	1
	නීති සහකාර	ආශ්‍රිත සෙවා	-	1	1	0
	මානව සම්පත් සහකාර	ආශ්‍රිත සෙවා	-	2	1	1
	පර්යේෂණ සහකාර	ආශ්‍රිත සෙවා	-	1	0	1
	විමර්ශන සහකාර	ආශ්‍රිත සෙවා	-	85	16	69
	තොරතුරු තාක්ෂණ සහකාර	ආශ්‍රිත සෙවා	-	2	0	2
	රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	රා.කළ.ස.සේ	1/11/111 පන්තිය	357	269	88
	කාර්මික නිළධාරී	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	4	2	2
	සංවර්ධන සම්බන්ධීකාරක	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	1	0	1
	රූපවාහිනි/ වීඩියෝ කැමරාකරු	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	1	1	0
	තානායම් පරිපාලක	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	1	0	1
	පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	2	1	1
	සම්බන්ධීකරණ ලේකම්	-	-	1	1	0
	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිළධාරි	ශ්‍රී. ලං.තො.තා.සං.සේවය	111 පන්තිය - 111 ශ්‍රේණිය (11/1)	6	1	5
	සැලසුම් ශිල්පී	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	1	1	0
	ප්‍රමාණ සමීක්ෂක	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	1	0	1
	සංවර්ධන නිලධාරී	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	25	99	-74
	එකතුව			493	394	99

තනතුරේ ස්වභාවය	තනතුර	අදාල වන සේවය	ශ්‍රේණිය	අනුමත මුළු තනතුරු සංඛ්‍යාව	සේවයේ නියුතු සංඛ්‍යාව	පුරප්පාඩු/ අතිරික්ත තනතුරු සංඛ්‍යාව
ප්‍රාථමික මට්ටම	විදුලි කාර්මික	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	3	3	0
	ජල නල කාර්මික	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	4	2	2
	රියදුරු	රියදුරු	1/11A/11B පන්තිය	68	45	23
	නිශ්චල ඡායාරූප ශිල්පී	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	1	1	0
	ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගතකිරීමේ ශිල්පී	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	1	1	0
	කාර්යාල සේවක සේවය	කාර්යාල සේවක සේවය	1/11/111 පන්තිය	88	80	8
	බංගලා භාරකරු	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	31	25	6
	සහයක බංගලා භාරකරු	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	6	4	2
	ගෘහ කම්කරු	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	6	6	0
	උද්‍යාන කම්කරු	-	-	1	2	-1
	පොම්පාගාර කම්කරු	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	3	0	3
	කම්කරු	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	4	1	3
	වායුසමීකරණ ශිල්පී	දෙපාර්තමේන්තු ගත තනතුරු	-	1	0	1
	එකතුව			**217**	**170**	**47**
එකතුව				**802**	**641**	**161**

අංශ හැඳින්වීම

■ ආයතන අංශය

රාජ්‍ය සේවා කොමිසම අක්‍රියවීමත් සමඟ රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ආයතන අංශය රාජ්‍ය අංශයේ ආයතන කටයුතු වලට අදාල සියළුම ප්‍රතිපත්තිමය පාර්ශවයන් කෙරෙහි වගකීමෙන් බැඳේ. අමාත්‍ය මණ්ඩල තීරණ හෝ නීති ප්‍රතිපාදන මත පදනම්ව සකසනු ලබන ප්‍රතිපත්ති හා නවීකරණයන් පිළිබඳව සාමාන්‍යයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් ප්‍රකාශයට පත් කෙරේ.

■ ඒකාබද්ධ සේවා අංශය

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ ඒකාබද්ධ සේවා අංශය ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සේවය, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය, භාෂා පරිවර්තක සේවය, පුස්තකාලයාධිපති සේවය, රියදුරු සේවය සහ කාර්යාල සේවක සේවය යන සේවාවන්හි බඳවා ගැනීම්, සේවයේ ස්ථිර කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු, විශ්‍රාම ගැන්වීම් සහ විනය කටයුතු වැනි මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම දරයි. 2013 වසර අවසානය වන විට සේවකයන් 59000 කගේ පමණ (විශ්‍රාමික සේවකයින්ගේ ඇතුළුව) පුද්ගලික ලිපි ගොනු මෙම අංශය මගින් කළමනාකරණය කෙරෙමින් පැවතිණි.

*අනුමත සේවක සංඛ්‍යාව හා වර්තමාන සේවක ගණන - **2013***

අංක	සේවාව	අනුමත සේවක සංඛ්‍යාව	සේවා නියුක්ත සේවක සංඛ්‍යාව
01	ශ්‍රී ලංකා පරිපාලන සේවය	2567	2272
02	ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සේවය	අන්තර්ග්‍රහණය සිදුකරමින් පවතී	808
03	රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	30694	26760
04	භාෂා පරිවර්තක සේවය	571	260
05	පුස්ථකාලාධිපති සේවය	546	253
06	කාර්යාල කාර්යය සහයක සේවය	12520	11550
07	රියදුරු සේවය	5162	4421

■ විශ්‍රාම වැටුප් හා නිවාස අංශය

රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප් කළමනාකරණය හා රාජ්‍ය සේවකයින් වෙත නිවාස පහසුකම් සැලසීමට අදාල කාර්යයන් කළමනාකරණය විශ්‍රාම වැටුප් හා නිවාස අංශයේ ප්‍රධාන වගකීම් වේ.

විශ්‍රාම වැටුප් කළමනාකරණයට අදාලව රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම් වෙත ව්‍යවස්ථානුකූලව පැවරුණු බලතල ක්‍රියාවට නැංවීම ද පවතින ප්‍රතිපත්තීන් හා නීති රෙගුලාසි සංශෝධනය ද නව නීති රීති පැනවීම ද විශ්‍රාම වැටුප් විෂයට අදාලව ඉටු කරනු ලබන සේවාවට අයත් වන අතර, අමාත්‍යාංශය යටතේ පාලනය වන රජයේ නිවාස 194ක් මඟින් රජයේ විවිධ මට්ටම්වල නිලධාරීන්ගේ හා මහජන නියෝජිතයන්ගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා කටයුතු සම්පාදනයද, දැනටමත් ක්‍රියාත්මක නව නිවාස ව්‍යාපෘතීන් කඩිනමින් නිම කිරීමේ කාර්යයට අමතරව, නව නිවාස ව්‍යාපෘතීන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම මඟින් අනාගත රාජ්‍ය සේවයට වඩා ඵලදායී සේවාවක් සැපයීමේ අරමුණ උදෙසා කටයුතු කිරීමද නිවාස විෂයට අයත් රාජකාරීන් වේ.

■ සංවර්ධන, පර්යේෂණ හා නඩත්තු අංශය

2013 ඔක්තෝම්බර් මාසය වන විට පරිපාලනමය ගොඩනැගිලි 29ක වැඩ අවසන් කර ඇති අතර, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් ඉඩම් වල නව ඉදිකිරීම් සිදුකිරීම, දැනට තිබෙන ඉදිකිරීම් නඩත්තු කිරීම, අමාත්‍යාංශය යටතේ වන ආයතන වල ඉදිකිරීම් පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කිරීම, ඉදිකිරීම් හා නඩත්තු සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම හා නිගමනයන් තුළින් පිරිවැය අඩු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම, නවීන විද්‍යාත්මක තාක්ෂණය යොදවා සේවා ලාභීන් සඳහා කාර්යක්ෂමව හා ඵලදායී සේවාවක් ලබාදීම පිණිස ගොඩනැගිලි ආශ්‍රිත භෞතික පරිසරයේ වෙනස් කිරීම් සිදුකිරීමට ව්‍යාපෘති යෝජනා සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම,ප්‍රාදේශීය සංවර්ධනයට අදාළ මධ්‍යකාලීන ආයෝජන සැලැස්මේ කාර්යභාරය අධීක්ෂණය කිරීම වර්තමානයේ මෙම අංශයට අයත් කාර්යයන් වේ.

ගැටුම් බල පැවැත්වූ ප්‍රදේශවල කඩිනම් ව්‍යාපෘති යටතේ යටිතල පහසුකම් නැංවීම පිණිස පරිපාලනමය ගොඩනැගිලි ඉදිකිරීම මූලික අරමුණ වූ CARE ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ අංශය ලෙස 2011 ජුනි මස සංවර්ධන හා පර්යේෂණ අංශය ස්ථාපිත කරන ලද අතර එහි නිලධාරීන්ගෙන් කොටසක් ව්‍යාපෘති කළමනාකරණ අංශය ලෙස මෙයට සම්බන්ධ වී ඇත. CARE ව්‍යාපෘතියේ පරිපාලනමය ගොඩනැගිලි 33ක් ඉදිකිරීම සම්බන්ධ කටයුතු මෙම අංශය යටතේ සිදුවූ අතර, 2013 ගොඩනැගිලි 2ක වැඩ කටයුතු 2013 වසරේ දෙසැම්බර් මාසය වන විට අවසන් කිරීමට නියමිතය. තවත් ගොඩනැගිලි දෙකක ඉදිකිරීම් කටයුතු 2014 මාර්තු මාසය වන විට අවසන් කිරීමට නියමිත අතර ඒ සමඟම ව්‍යාපෘතියද නිම වේ.

සංවර්ධන හා පර්යේෂණ අංශය යටතේ ඇති e BMD ව්‍යාපෘතිය මඟින් උප්පැන්න, විවාහ හා මරණ සහතික පරිගණක ගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක අතර පරිලෝකන කටයුතු හා පරිගණක දෘඩාංග සැපයීමේ හා ප්‍රසම්පාදන කටයුතු මෙම වැඩසටහන මඟින් ක්‍රියාත්මක වේ.

2011 සැප්තැම්බර් මාසයේදී නඩත්තු අංශයද සංවර්ධන හා පර්යේෂණ අංශයටඅනුයුක්ත කරන ලද අතර, කොළඹ 05, කැප්පෙට්පොල මාවත, සමුළු නිවාස 104ක් ද, කොළඹ 08, කොටා පාර, නිවාස 02ක්ද, ජයවඩනගම නිවාස 08 ක්ද, රජයේ බංගලා නිවාස 05ක පමණ ද ඊට අමතරව කොළඹ 04, ලෝරිස් පාරේ ගරු අමාත්‍යවරුන්ට

හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ට වෙන්කර ඇති ඒකක 20කින් යුත් නිවාස සංකීර්ණයේ ද නඩත්තු කටයුතු වාර්ෂිකව මෙම අංශය මඟින් සිදු කරනු ලැබේ.

එමෙන්ම මෙම අමාත්‍යාංශයට අයත් කොළඹ -05, කැප්පෙටිපොල මාවතේ නිවාස සංකීර්ණයේ, කොළඹ -08, ගෝතමී පාර නිවාස සංකීර්ණයේ හා රාගම නිවාස සංකීර්ණයේ ,සැලසුම් ඉදිරිපත් කිරීම, ආයෝජන රැස්වීම් හා ඉදිකිරීම් ප්‍රගති සමාලෝචන රැස්වීම් සම්බන්ධීකරණය කිරිමද මෙම අංශයට පැවරී ඇත.

◙ ස්වදේශ කටයුතු අංශය

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු පිළිබඳ අංශය දිස්ත්‍රික් පරිපාලනය, ප්‍රාදේශීය පරිපාලනය, ග්‍රාමීය මට්ටමේ සේවා සම්පාදනය සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව යන පරිපාලන අංශ වලින් සමන්විත වන අතර එය විමධ්‍යගත සේවා සම්පාදනය සහ පරිපාලනය සිවිල් ලියාපදිංචිය සහ විමධ්‍යගත පරිපාලනය අධීක්ෂණය සම්බන්ධයෙන් වග කියයි.

පළාත්වල අනුව පරිපාලන කාර්යාලයන්හි සාරාංශ සටහනක්

අ.අ.	පළාත	දි.ලේකා සංඛ්‍යාව	ප්‍රා.ලේකා සංඛ්‍යාව	ග්‍රාම නිළධාරී කොට්ඨාශ සංඛ්‍යාව
01	මධ්‍යම පළාත	03	36	2224
02	නැගෙනහිර පළාත	03	45	1078
03	උතුරු පළාත	05	33	912
04	උතුරු මැද පළාත	02	30	997
05	වයඹ පළාත	02	46	2153
06	සබරගමුව	02	28	1148
07	දකුණු පළාත	03	47	2122
08	බස්නාහිර පළාත	03	40	2497
09	ඌව පළාත	02	26	886
එකතුව		**25**	**331**	**14022**

◙ පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය

මානව සම්පත් කළමණාකරනය, තොරතුරු හා සංනිවේදන තාක්ෂණය භාවිතය ප්‍රතිසංස්කරණ මූලාශ්‍රයන් හා ව්‍යාපෘති කළමණාකරණය යන කරුණු පරිපාලන ප්‍රතිසංස්කරණ අංශයේ විෂය පථයට ඇතුළත් වෙයි.

- මෙහිදී මානව සම්පත් කළමණාකරණ ඒකකය මගින් දේශීය, විදේශිය පුහුණු කටයුතු හා කළමණාකරණ ප්‍රතිසංස්කරණ ඉටු කරනු ලබන අතර අදාල දත්ත පද්ධති පරිපාලනය කිරිමද සිදුකරනු ලබයි.
- එසේම තොරතුරු තාක්ෂණ ඒකකය රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ තොරතුරු හා සංනිවේදන තාක්ෂණ යටිතල පහසුකම් කටයුතු පිළිබඳ වගකීම් දරයි

◙ අභ්‍යන්තර පාලන අංශය

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශයෙහි මානව සම්පත් කළමනාකරණය, වාහන ඇණියෙහි නඩත්තු කටයුතු, අපද්‍රව්‍ය කළමනාකරණය හා උපයෝගිතා කළමනාකරණය සම්බන්ධ වගකීම දරනා අංශය වන්නේ අභ්‍යන්තර පාලන අංශයයි. ඊට අමතරව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි ආයතනිකමය කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන්නේද මෙම අංශය විසිනි.

◙ විමර්ශන හා මෙහෙයුම් අංශය

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විමර්ශන හා මෙහෙයුම් අංශය අමාත්‍යාංශය, විශ්‍රාම වැටුප් හා රේජිස්ට්‍රාල් ජෙනරල් දෙපාර්තමේන්තව, දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරී කාර්යාල යන ආයතනයන්හි විමර්ශන හා මෙහෙයුම් කටයුතු පිළිබඳ වගකිම දරයි. විමර්ශන හා මෙහෙයුම් අංශය මඟින් අමාත්‍යාංශයීය ඉලක්කයන් හා අරමුණු කාර්යක්ෂම හා නිවැරදිව ඉටුකර ගැනීම සහතික කරනු ලැබේ. අංශය මඟින් විධිමත්ව විමර්ශන කටයුතු සිදුකර ඔවුන්ගේ සොයා ගැනීම්, යෝජනා හා නිර්දේශ සමඟ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කිරිම සිදුකරනු ලබයි. මෙම විමර්ශන සඳහා අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ඇති අනෙකුත් ආයතනවල කාර්යයන් පිළිබඳ වු පැමිණිලි ද ඇතුලත් වේ.

◙ මූල්‍ය අංශය

මූල්‍ය අංශය දිස්ත්‍රික් ගිණුම්, මූල්‍ය වාර්තාකරණ, ගෙවීම් හා ප්‍රසම්පාදන යන ප්‍රධාන ශාඛාවන් 04 කින් යුක්ත වන අතර එකී අංශ 4 මගින් කරනු ලබන කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

ශාඛාව	කාර්යයන්
දිස්ත්‍රික් ගිණුම්	සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල සහ සංචාරක නිවාස ඇතුළු නිවාඩු නිකේතන වල විවිධ අවශ්‍යතා වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර දීම, එහි වියදම් අධීක්ෂණය හා ඉතිරි ප්‍රතිපාදන පවරා ගැනීමට කටයුතු කිරීම , සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ආදායම් ශීර්ෂ 10.03.07.99 යටතේ එකතු කරනු ලබන ආදායම පිළිබඳ වාර්ෂික ගිණුම පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම, සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අයත් මූලධන වියදම්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය අධීක්ෂණය කිරීම, දිස්ත්‍රික් ගිණුම් ශාඛාව මගින් සිදුකරනු ලබන කාර්යයන් අතරින් කිහිපයකි.
මූල්‍ය වාර්තාකරණ	අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා දි.ලේ.කා වල අදාල විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම හා අමාත්‍යාංශය, වි.වැ.දෙ හා රෙ.ජ.දෙ සම්බන්ධ රාජ්‍ය ගිණුම් කාරක සභා (COPA) කටයුතු හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා (COPE) කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, අමාත්‍යාංශයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම , හානි ලේඛනය නඩත්තු කිරීම හා හානි සම්බන්ධයෙන් පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය විධිමත් කිරීමට පියවර ගැනීම , අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීම හා අමාත්‍යාංශය ඇතුළු අනුබද්ධ ආයතන වල හා දි.ලේ.කා වල වාර්ෂික කාර්යසාධන වාර්තා හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වාර්ෂික වාර්තාව, පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීමට පියවර ගැනීම, වත්කම් රෙජිස්ටරය යාවත්කාලීනව පවත්වාගෙන යාම, වි.වැ.දෙ., රෙ.ජ.දෙ. හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ මූල්‍ය කටයුතු අධීක්ෂණය, අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රියාවලි විධිමත් කිරීම සඳහා ප්‍රධාන ගණකාධිකාරීගේ මඟ පෙන්වීමට අනුව අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම යනාදී කාර්යයන් මූල්‍ය වාර්තාකරණ ශාඛාව මගින් සිදුකරනු ලබයි.
ගෙවීම්	අමාත්‍යංශයේ සියලු ම නිලධාරීන්ගේ වැටුප් සැකසීම , අතිකාල දීමනා, ගමන් වියදම් දීමනා, 1/20 දීමනා, යතුරු දීමනා හා පුහුණුවන අයට අදාල දීමනා ගෙවීමට , අමාත්‍යංශයේ සිට විශ්‍රාම යන නිලධාරීන්ට අදාල ගෙවීම් ලබා ගැනීම සඳහා ආකෘති පත්‍ර සැකසීම හා තැපැල් කිරීම , රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමට අදාල කටයුතු කිරීම , විවිධ වෘත්තීය සමිති සංගම් වලට අදාල සාමාජික මුදල් හා ලබා දුන් ණය මුදල් වාරිකව අය කිරීම , දෛනික ලැබීම් ගෙවීම් වවුචර්වල දත්ත නව සිගාස් (CIGAS) පරිගණක වැඩසටහනට ඇතුළත් කිරීමත් , අමාත්‍යාංශයේ ලැබීම් හා ගෙවීම් පිළිබඳ මාසික ගිණුම් සාරාංශය පිළියෙළ කොට එම ගිණුම් තොරතුරු මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපා. වෙත වාර්තා කිරීම සහ වර්ෂය තුල වැය කරනු ලබන සියළුම වියදම් තොරතුරු ආශ්‍රයෙන් වාර්ෂික විසර්ජන ගිණුම පිළියෙල කර මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත භාරදීම, පොදු තැන්පත් ගිණුම සහ රජයේ නිලදාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමට අදාල වාර්ෂික සැසඳුම් වාර්තාද මාර්තු 31 දිනට පෙර පිළිවෙළින් රාජ්‍ය ගිණුම් දෙපා. වෙත සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සහ බැංකු සැසඳුම් වාර්තා මාසිකව පිළියෙළ කිරීම යනාදිය ගෙවීම් ශාඛාව මගින් සිදුකරනු ලබයි
ප්‍රසම්පාදන ශාඛාව	අමාත්‍යාංශයේ වී වී අංශ වල අවශ්‍යතාව අනුව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම, ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා ඊට අදාළ සංශෝධන වල විධිවිධාන වලට අනුව සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරමින් ඉහත සඳහන් ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව භාණ්ඩ හා සේවා සැපයීම (වාර්ෂිකව අවශ්‍ය වන ලිපි ද්‍රව්‍යද ඇතුළුව). අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සඳහා වාර්ෂික ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණ ඇගයීම් කමිටු පත් කිරීම , අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හා අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සම්බන්ධීකරණ කටයුතු කිරීම, අමාත්‍යාංශයේ භාවිතා කරන කාර්යාල උපකරණ අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සේවා ගිවිසුම් වලට එළඹීම, ගබඩා කළමනාකරණ කටයුතු කිරීම, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ඉදිකිරීම් සම්බන්ධයෙන් අදාළ සීමාව තුළ අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කටයුතු හා අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම යනාදී කාර්යයන් ප්‍රසම්පාදන ශාඛාව මගින් සිදුකරනු ලබයි.

◙ අභ්‍යන්තර විගණක අංශය

අමාත්‍යංශය හා අමාත්‍යංශය යටතේ පාලනය වන දෙපාර්තමේන්තු හා ආයතනවල මූල්‍ය කටයුතු පිළිබඳව පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වී, එම කටයුතු වල වැරදි හා වංචා වැළැක්වීම සහ ඒවා නිවාරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියන්ගේ විධිමත්භාවය හා ප්‍රමානාත්මකභාවය පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පැවැත්වීම තුළින් යහපාලනය ප්‍රවර්ධනය කිරීම.

◙ ශ්‍රී ලංකා ඉංජිනේරු, විද්‍යාත්මක, වාස්තු විද්‍යාත්මක හා තාක්ෂණ සේවා අංශය

- ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය
- විද්‍යාත්මක සේවය
- වාස්තු විද්‍යාත්මක හා තාක්ෂණ සේවා අංශය

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් ශ්‍රී.ලං.ඉං.සේ, ශ්‍රී.ලං.වි.සේ, ශ්‍රී.ලං.වා.වි.සේ හා ශ්‍රී.ලං.තා.සේ හි මානව සම්පත් කළමනාකරණය සිදු කෙරිණි. එය රාජ්‍ය සේවා කොමිෂම මගින් පවරන ලද කාර්යයක් වුවද, රාජ්‍ය සේවා කොමිෂම ක්‍රියාත්මකව නොමැති තත්වයක් යටතේ ශ්‍රී.ලං.ප.සේ, ශ්‍රී.ලං.වා.සේ. බඳවා ගැනීම් ස්ථිර කිරීම්, උසස් කිරීම්, ස්ථානමාරු, විශ්‍රාම සහ විනය කටයුතු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් ඉටු කෙරේ. මෙසේ කෙරෙනුයේ අමාත්‍යාංශයට ශ්‍රී.ලං.තා.සේ. මානව සම්පත් කළමනාකරණයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳව පමණක් වගකීම පැවරෙද්දීය. ශ්‍රී.ලං.තා.සේ. බඳවා ගැනීම්, ස්ථිර කිරීම්, උසස් කිරීම්, විශ්‍රාම ගැනීම් හා විනය කටයුතු පළාත් සභා වලට පැවරී තිබේ.

2013 වසරේදී අනුමත කරන ලද සේවක සංඛ්‍යාව

අංකය	සේවාව	අනුමත සේවක සංඛ්‍යාව	වර්ථමාන සේවක සංඛ්‍යාව
01	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	1331	1083 (2012-12-31 දිනට)
02	විද්‍යාත්මක සේවය	541	323
03	වාස්තු විද්‍යාත්මක සේවය	57	35
	මුළු එකතුව	**1,929**	**1,441**

◙ <u>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව</u>

වර්ෂ 1800 මැදගණන් වල රජයේ සේවයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මූලාරම්භ වූ අතර වර්ෂ 1970 දී පිහිට වූ විශ්‍රාම වැටුප් දෙපාර්තුමේන්තුව, විවිධ විශ්‍රාම වැටුප් ක්‍රම කළමණාකරණයන් සඳහා වගකීම් දරයි. වර්තමානයේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ ගැනෙන යුධ හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත සංග්‍රහයන්, වැන්දඹු, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ගණන් සහ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ගණන විශ්‍රාම වැටුප් දෙපාර්තුමේන්තුව විසින් කළමණාකරණය කරනු ලබයි. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන්හි වරප්‍රසාදයන් පළාත් පාලන, හමුදා, නීති ඇතුලත්ව රජයේ සේවයේ නිලධාරීන්ට හා වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ රජයේ අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභීන් වෙත ලැබේ.

◙ <u>රෙජිස්ට්‍රාර් ජනරල් දෙපාර්තමේන්තුව</u>

වර්ෂ 1864 දී පිහිටවනු ලැබූ මෙම දෙපාර්තුමේන්තුව ශ්‍රී ලංකාවේ නිශ්චල හා චංචල දේපල වලට අදාල නීත්‍යානුකූල ලේඛණ හා හිමිකම් ලියාපදිංචි කිරීම සහ ජන ජීවිතයේ මූලික ගෘහස්ථ සිදුවීම් වන විවාහ, උපත් සහ මරණ ලියාපදිංචි කිරීමෙන්ද, එම ලේඛණ සංරක්ෂණය කිරීම සහ එම ලේඛණ වලින් සහතික පිටපත් නිකුත් කිරීමෙන්ද, අයිතීන් රැක ගැනීම පිණිස ජනතාවට සහායවනු ලැබේ.

◙ <u>ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)</u>

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ ප්‍රධාන කළමණාකරණ පුහුණු ආයතනය ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (පරිපාලන අධ්‍යයන විද්‍යායතනයේ අනුප්‍රාප්තිකයා) ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ විධිමත් උපාධි පිරිනැමීමට බලය ලද ආයතනය බවට පත්ව තිබේ. ඒ අනුව එමගින් රාජ්‍ය කළමණාකරණ පශ්චාත් උපාධි වැඩසටහන්, ඩිප්ලෝමා වැඩසටහන්, සහතික පාඨමාලා, ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා සැලසුම් සේවය හා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවාරම්භක පුහුණු පවත්වනු ලබයි. එසේම එම ආයතනය මගින් පර්යේෂණ, පුහුණු උපදේශන ප්‍රකාශන කටයුතු ද කළමණාකරණ උපදේශන කටයුතු ද ඉටු කරනු ලබයි.

රාජ්‍ය සේවයේ ප්‍රාථමික හා ද්විතීයික ගණයේ නිලධාරීන් පුහුණු කිරීම සඳහා රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ පැවති රාජ්‍ය සේවා පුහුණු ආයතනය ද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත 2013 වර්ෂයේදී අන්තර්ග්‍රහනය කරන ලදි.

සුවිශේෂී කාර්ය සාධනය
-2013-

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

1. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ භාවිතය

- **ඉ- මානව සම්පත් කළමනාකරණ පද්ධතිය (E-HRM)**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවාවන්ට අයත් මානව සම්පත් කළමනාකරණ ක්‍රියාකාරකම් කාර්යක්ෂමව හා ඵලදායිව ඉටු කර ගැනීමේ අරමුණ ඇතිව අභ්‍යන්තරිකව සිදුකරනු ලබන සියළුම මානව සම්පත් පරිපාලනමය කටයුතු ස්වයංක්‍රීයකරණයට ලක්කරමින් ඉ-මානව සම්පත් වැඩසටහන යටතේ 2013 වර්ෂයේ සැප්තැම්බර් මස වන විට ශ්‍රී ලංකා පරිපාලන සේවය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාව,රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය, කාර්යාල සේවක සේවය, භාෂා පරිවර්තක සේවය සහ පුස්තකාලයාධිපති සේවය යන්නෙන් සමන්විත නිලධාරීන් 52,739 ක ගේ පෞද්ගලික මානව සම්පත් තොරතුරු ස්වයංක්‍රීයකරණයට ලක්කර ඇති අතර පද්ධතියේ ඉදිරි සංවර්ධන කටයුතු තවදුරටත් සිදු කරමින් පවති.

2. මානව සම්පත් කළමනාකරණය

- **රාජ්‍ය සේවයේ නව බඳවා ගැනීම්**

විශිෂ්ට රාජ්‍ය සේවයක් සහතික කිරීම උදෙසා අත්‍යවශ්‍ය වන්නාවූ කාර්යක්ෂම සහ ඵලදායී මානව සම්පතකින් රාජ්‍ය සේවය පෝෂණය කිරීමේ අරමුණින් 2013 වසරේදී ඉටුකර ඇති බඳවා ගැනීම් සහ උසස් කිරීම් හි සාරාංශය පහත දැක්වේ.

• ශ්‍රී ලංකා පරිපාලන සේවය	112
• රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	2678
• රියදුරු සේවය	332
• කාර්යාල සේවක සේවය	671
• වාස්තු විද්‍යාත්මක සේවය	08
• ග්‍රාම නිලධාරීන්	11
• කාර්මික නිලදාරී	12
මුළුඑකතුව	**3824**

- **රාජ්‍ය නිලධාරීන්ගේ උසස්වීම්**

2013 වසරේදී අදාළ සේවාවන්හි නිලධාරීන් 2,349ක් උසස් කරනලදි. සේවාවන් මත පදනම්ව කරන ලද උසස්වීම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

• ශ්‍රී ලංකා පරිපාලන සේවය	116
• රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	1284 (උසස්වීම් ලබා දීමට නියමිතය)
• රියදුරු සේවය	89
• කාර්යාල සේවක සේවය	228

මුළුඑකතුව 1717

දිස්ත්‍රික් හා ප්‍රදේශීය සංවර්ධන වැඩසටහන් කළමණාකරනය සඳහා වන ව්‍යාපෘතිය යටතේ සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් බඳවා ගන්නා ලද උපාධිධාරී අභ්‍යසලාභීන්, එක් එක් අමාත්‍යාංශ වල අවශ්‍යතාවය පරිදි වසරක පුහුණුව සම්පූරණ කිරීමේන් පසුව සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව යටතේ සංවර්ධන නිලධාරී සේවයේ III තනතුර වෙත බඳවාගැනිම සිදුකරනු ලබයි. මේ වන විට උපාධිධාරී අභ්‍යසලාභීන් 38846 දෙනෙකු වෙත ස්ථිර පත්වීම් ලිපි නිකුත් කර ඇත.

තවද, සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ රජයේ ප්‍රතිපත්තිය මත 1999- 2005 දක්වා කාලය තුල විවිධ තනතුරු නාම යටතේ රජ්‍ය සේවයට බඳවා ගත් උපාධිධාරීන් සංවර්ධන නිලධාරී සේවය වෙත අන්තර්ග්‍රහණය කිරිමද සිදු කරනු ලබයි.

3. නිපුණතා සංවර්ධනය

- **ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පුළුල් වූ විෂය පරාසයක් තුල පහත සඳහන් පරිදි පුහුණු පාඨමාලා පැවැත්වීමට සමත් විය.

	වැඩසටහන		**සංඛ්‍යාව**
1.	සේවාරම්භක පුහුණු පාඨමාලා	-	02
2.	ධාරිතා සංවර්ධන පාඨමාලා	-	02
3.	ඩිප්ලෝමා පාඨමාලා	-	06
4.	සහතික පත්‍ර පාඨමාලා	-	06
5.	**කෙටිකාලීන පාඨමාලා**		
1.	මාණ්ඩලික	-	17
2.	මාණ්ඩලික නොවන	-	67
3.	මාණ්ඩලික නොවන විඩියෝ තාක්ෂණය හරහා කරන පාඨමාලා	-	20
4.	තිරස් සමායෝජන වැඩසටහන්	-	06
5.	පුහුණු උපදේශන පාඨමාලා	-	51
6.	කළමනාකරණ උපදේශන පාඨමාලා	-	09
7.	පශ්චාත් උපාධි පාඨමාලා	-	04
8.	බාහිර ආයතන සඳහා පැවති විභාග	-	58
9.	නේවාසික පහසුකම් ලබාගත් පුහුණු වන්නන් සංඛ්‍යාව	-	3089

- **මානව සම්පත් සංවර්ධන ඒකකය**

විදේශිය පුහුණු අවස්ථා සම්බන්ධ තොරතුරු පද්ධතියක් නිර්මාණය කරමින් වඩා ඉහල කාර්යක්ෂමතාවයක් යටතේ මානව සමපත් සංවර්ධන ඒකකය පහත සඳහන් පරිදි විදේශිය පුහුණු අවස්ථා නිලධාරීන් වෙත උදාකරලීමට සමත් විය.

	කෙටි කාලීන	**පශ්චාත් උපාධි**	**එකතුව**
නාම යෝජනා ඉදිරිපත් කල සංඛ්‍යාව	219	52	**271**
තේරිපත් වූ සංඛ්‍යාව	107	13	**120**

අමාත්‍යාංශයීය වෙබ් අඩවිය හා ඊ මේල් පහසුකම් යොදා ගනිමින් පුහුණු අවස්ථා පිළිබඳ සමස්ථ දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්හි නිලධාරීන් දැණුවත් කිරීමට ක්‍රියාකල අතර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හා එක්ව විදේශිය ශිෂ්‍යත්ව අයදුම් කරුවන් සඳහා පෙර සුදානම් කිරීමේ වැඩසටහන් සංවිධානය කෙරිණ.

එසේම, පහත සඳහන් පරිදි නිලධාරීන් සඳහා දේශිය පුහුණු අවස්ථා උදාකරලීමට ද කටයුතු කර ඇත.

	පශ්චාත් උපාධි	**ඩිප්ලෝමා**	**කෙටිකාලීන**	**එකතුව**
දේශීය පුහුණු පාඨමාලා සඳහා යොමු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව	26	11	341	**378**

4. සිවිල් ලියාපදිංචිය

- **උපත්, විවාහ හා මරණ සහතික අංකිතකරණය**

උපත්, විවාහ හා මරණ සහතික අංකිත කිරීම උදෙසා ඉ-උපත්, විවාහ හා මරණ ලේඛන ගතකිරීමේ ව්‍යාපෘතිය රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යංශය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව හා එක්ව ක්‍රියාත්මක කරමින් පවතී.

මෙම වර්ෂය තුළ ව්‍යාපෘතිය මඟින් ආවරණය කල ප්‍රදේශයන් පහත සඳහන් වේ.

	ආවරණය කරන ලද දිස්ත්‍රික්කය/ ප්‍රදේශ ලේකම් කාර්යාලය	පිටපත් නිකුත් කරන කාර්යාල
1	පුත්තලම දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ	පුත්තලම දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල
2	නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය	නුවරඑළිය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල
3	කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ	කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල
4	මුලතිව් දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ	මුලතිව් දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල
5	අම්පාර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ	අම්පාර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල
6	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ	ත්‍රිකුණාමලය නගරය සහ කඩවත් සතර, කින්නියා ප්‍රාදේශිය ලේකම් කාර්යාල
7	මඩකලපුව දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ	මඩකලපුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

5. විමර්ශන හා මෙහෙයුම්

අමාත්‍යාංශයීය විමර්ශනය අංශය සේවා ලාභීන්ගෙන් ලද පැමිණිලි විමර්ශනයට ලක් කිරීම හා ඒ සම්බන්ධව ගන්නා ලද තීරණයන් පහත පරිදි වේ.

1. ලැබුණු පැමිණිලි - 472
2. සිදුකල මූලික විමර්ශන - 156
3. චෝදනා පත්‍රය නිකුත් කිරීම - 22
4. වාර්තා කැඳවා විසඳන ලද පැමිණිලි - 254
5. කාර්යාල විමර්ශන (දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමේ) - 09

6. රාජ්‍ය අංශය සඳහා සිදුකල බඳවා ගැනීම්(2009 – 2013)

2009 – 2013 වසර 5 තුලදී රාජ්‍ය අංශය සඳහා සිදුකල නව බඳවා ගැනීම් පහත සේවවන් යටතේ වර්ගීකරණය කර දක්වා ඇත.

සේවාව	2009	2010	2011	2012	2013
ශ්‍රී ලංකා පරිපාලන සේවය	-	135	261	46	112
රාජ්‍ය කළමණාකරන සහකාර සේවය	830	323	4501	578	2678
රජයේ භාෂා පරිවර්තක සේවය	-	97	-	54	-
ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවය	-	-	34	-	-
ග්‍රාම නිලදාරී සේවය	2189	380	08	-	11
කාර්මික නිලධාරී - ශ්‍රී ලංකා තාක්ෂණ සේවය	-	-	25	-	12
සැලසුම් නිලධාරී - ශ්‍රී ලංකා තාක්ෂණ සේවය	03	-	-	-	-
පිලිගැනීමේ නිලධාරී	46	-	01	02	-
ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	38	374	-	139	-
විද්‍යාත්මක සේවය	-	26	46	16	-
වාස්තු විද්‍යාඥ සේවය	03	-	-	-	08
කාර්යාලසේවකසේවය	607	1178	904	630	671
රියදුරුසේවය	223	279	187	275	332
එකතුව	**3939**	**2792**	**5967**	**1740**	**3824**

7. මූල්‍ය අධීක්ෂණ කාර්යයන්

- මූල්‍ය වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම

ආයතනය	විසර්ජන ගිණුම		රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම		ගිණුම් ශීර්ෂය ආදායම් ගිණුම		කාර්යය සාධන වාර්තා		අරමුදල් වලට අදාල වාර්තා	
	2012	2013	2012	2013	2012	2013	2012	2013	2012	2013
අමාත්‍යංශය	1	1	1	1	1	1	1	1	-	-
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	1	1	1	1	1	-	1	-	05	03
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව	1	1	1	1	1	-	1	1	1	-
දිස්ත්‍රික් ලේකම් කාර්යාල	25	25	25	25			25	03		

- විගණන විමසුම් වල ප්‍රගතිය

ලේකම් රා.පරි. හා ස්ව. කට අමාත්‍යාංශය නමින් 2012 වසරේ දී විගණන විමසුම් 21 ක් ද 2013 වර්ෂයේදී විගණන විමසුම් 16 ක් ද විගණකාධිපති විසින් නිකුත් කර ඇති අතර එම සියලුම විගණන විමසුම් සඳහා මේ වන විට පිලිතුරු ඉදිරිපත් කර ඇත.

විගණන විමසුම්	2012 වර්ෂය	2013වර්ෂය
අමාත්‍යාංශයට අදාළව	11	12
දි.ලේ.කා වලට අදාළව	-	-
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තවට අදාළව	04	-
රේජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවට අදාළව	01	-
ව්‍යාපෘති වලට අදාළව	05	04
එකතුව	**21**	**16**

- අභ්‍යන්තර පාලන ක්‍රියාවලියන් අධීක්ෂණයේදී හඳුනාගන්නා ලද දෝෂයන් නිවැරදි කිරීම පිණිස කරන ලද දැනුවත් කිරීම් හා විශේෂිත දැනුවත් කිරීම්

අනු අංකය	කාරණය	දැනුවත් කළ පාර්ශවය	ගොනු අංකය	දිනය
01	වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම් නිසිපරිදි කාලරාමුවට අනුව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා	රෙජිස්ට්‍රාර් ජනරාල්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්, සියළුම දිස්ත්‍රික් ලේකම්වරු	PA/F/FR/2012/02/04/01	2013.01.30
02	සියළුම ජංගම ගිණුම්වලට අදාල බැංකු සැසඳුම් ඉදිරිපත් කරන ලෙස දැනුවත් කිරීම	අධ්‍යක්ෂ (SLIDA)	F/ FR /SLIDA/ 08/01	2013.12.06
03	අමාත්‍යාංශයේ සංචිත වාහන සම්බන්ධයෙන් මනා අභ්‍යන්තර පාලනයක් හා සුපරීක්ෂණයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (අභ්‍යන්තර පාලන)	PA/F/FR/01/02/2012/09	2012/12/
04	උපචිත පදනම යටතේ ගිණුම් තැබීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම	විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්	PA/F/FR/01/02/2012/12	2013/07/18
05	වාර්ෂික අයවැය ඇස්තමේන්තු - 2013 පිළියෙල කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම	අතිරේක ලේකම් (අභ්‍යන්තර පාලන, රාජ්‍ය පරිපාලන, විමර්ෂණ, ස්ව. කටයුතු) , අධ්‍යක්ෂජනරාල්(ආයතන, ඒකාබද්ධ සේවා, අධ්‍යක්ෂ (SLIDA), ව්‍යාපෘති කළමනාකරු (GLed) , ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	P.Ad/F/FR/02/i/125	2013/01/29
06	කාර්තුමය ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් වලට අදාල තොරතුරු එවීමේදී තිබෙන්නාවූ දුර්වලතා මගහැරවීම	ප්‍ර.ග (රෙ.ජ.දෙපා.) ප්‍ර.ග (වි.වැ.දෙ) ප්‍ර.ග(සියළුම දි.ලේ.කා)	ACC/2/CE/07-II	2013.11.28
07	දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක කරන නව ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම	අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු), ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන, පර්යේෂණ හා නඩත්තු),	PA/F/FR/04/03/General/01	2013.06.5
08	රජයේ ආයතන විසින් දැනටමත් ඉදිකරමින් පවතින ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු අවසන් වීමට පෙර, නව ඉදිකිරීම් ආරම්භ කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීම	රෙජිස්ට්‍රාර් ජනරාල්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්, සියළුම දිස්ත්‍රික් ලේකම්වරු.	PA/F/FR/04/03/General/01	2013.11.11
09	දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා නිල නිවාස ඉදිකිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම.	අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු), ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන, පර්යේෂණ හා නඩත්තු),	PA/F/FR/04/03/General/01	2013.06.4
10	2013 වර්ෂයේ තොග සමීක්ෂණය පැවැත්වීම පිළිබඳව සමීක්ෂණ මණ්ඩල නිලධාරීන්ට උපදෙස්	සියළුම අංශ ප්‍රධානීන් වෙත	F/FR/04/BOS(General)	2013/12/10
11	2013 වර්ෂයේ තොග සමීක්ෂණය පැවැත්වීම පිළිබඳව උපදෙස් ලබා දීම	රෙජිස්ට්‍රාර් ජනරාල්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්, සියළුම දිස්ත්‍රික් ලේකම්වරු. අධ්‍යක්ෂ(SLIDA)	F/FR/04/BoS (General)	2013.12.10

2013/07/08 දින, අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැති ප්‍රගති සමාලෝචන රැස්වීම

அதி மேன்மை தங்கிய ஜனாதிபதி தலைமையில் முன்னேற்ற மீளாய்வு கூட்டம் 08/07/2013 ஆம் திகதி நடைபெற்றது

Progress Review Meeting held on 08/07/2013 under the leadership of H.E the President

රජය නිලධාරීන් සඳහා සම්මාන පිරිනැමීම

விருது வழங்கல் வைபவம்

Award Ceremony

බක්මහ අවුරුදු උත්සවය - 2013

புத்தாண்டு விழா-2013

New Year Festival – 2013

ශ්‍රී ලංකා මොබිටෙල් සහ අමාත්‍යාංශය අතර විශේෂ කෙටිපණිවුඩ හා විශේෂ දුරකතන සම්බන්ධතාවයක් ලබාදීම සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමක් අත්සන්කිරීම

அமைச்சு அலுவலர் மற்றும் மாவட்டச்செயலக அலுவலர்களுக்கு விசேடமொபிரலின் பொதி மற்றும் குறுந்தகவல் வழங்குவதற்கான புரிந்துணர் உடன்படிக்கை அமைச்சு மற்றும் ஸ்ரீலங்காமொபிரலுக்கடையில் ஏற்படுத்தப்பட்டது

MOU signed with Ministry & Sri Lanka Mobitel in respect of providing special mobitel package and SMS service to the Ministry staff and staff in DSs.

සුබසාධන වැඩසටහන් පැවැත්වීම

அலுவலர் நலன்புரி நிகழ்ச்சித்திட்டம்

Staff welfare program

දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල

තොරතුරු

අමාත්‍යාංශය යටතේ පවතින දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල පොදු දත්ත

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල	ග්‍රාම සේවා වසම් ගණන	ජනගහනය	ජන්ද දායකයින් සංඛ්‍යාව	නගර සභා සංඛ්‍යාව	මහනගර සභා සංඛ්‍යාව	ප්‍රාදේශීය සභා ගණන	මන්ත්‍රී ආසන සංඛ්‍යාව	පළාත් සභා මන්ත්‍රී සංඛ්‍යාව	ජනතාවගේ ජීවනෝපාය/වෙළඳ රටාව	කාර්යමණ්ඩලය		සංචාරක බංගලා/නිවාඩු නිකේතන ගණන
											අනුමත	සත්‍ය	
01.කුරුණෑගල	30	1610	1644835	1248947	1	1	18	15	34	කෘෂිකර්මය,කර්මාන්ත හා සේවා	112	105	1
02.වව්නියාව	4	505	195529	104252	0	1	4	1	6	කෘෂි අපනයන,ධීවර කර්මාන්තය,ව්‍යාපාර කටයුතු	411	257	0
03.මාතර	16	650	809344	599009	1	1	15	8	18	වී ගොවිතැන,තේ රබර් පොල්,අපනයන බෝග හා එළවළු පළතුරු වගාව/ධීවර කර්මාන්තය	1396	1248	1
04.මන්නාරම	5	153	155556	78493	1	0	0	1	5		401	290	1
05.කළුතර	14	762	1248305	867812	0	1	12	235	22	තේ රබර් හා පොල්,අපනයන බෝග හා වී වගාව	2965	3520	නැත
06.මුලතිවු	6	136	127892	58294			4	1	5		367	211	1
07.යාපනය	15	435	610640	441509	1	3	13	10	16	බෝග වගාව,ධීවර කර්මාන්තය හා තල් ආශ්‍රිත නිෂ්පාදන	105	91	1
08.කෑගල්ල	11	573	836603	644803	1	0	11	9	19	කෘෂිකර්මය පදනම් කරගත් ජීවන රටාවක් දක්නට ඇත	1179	941	නැත
09.මාතලේ	11	545	482229	373315	0	2	11	4	11	ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තයයි.සුළු අපනයන භෝග වගාවද එළවළු නිෂ්පාදනය හා අලෙවිය ජනතාවගේ ප්‍රධාන ආදායම් මාර්ගයයි.	81	73	1
10.මහනුවර	20	1188	1369899	1031980	4	1	17	13	29		65	63	1
11.මඩකලපුව	14	345	586400	358205	2	1	9	3	11	ප්‍රධාන ජීවන වෘත්තිය ලෙස කෘෂිකර්ම,ධීවර,ව්‍යාපාර ආදිය.	1139	991	2
12.මොණරාගල	11	319	448142	332764	0	0	10	5	12		900	698	2
13.ත්‍රිකුණාමලය	11	230	378182	251684	2	0	11	4	10	කෘෂිකර්මාන්තය,ධීවර කර්මාන්තය,සත්ත්ව පාලනය,වානිජ කටයුතු සහ රජයේ සහ පුද්ගලික අංශයේ රැකියා	1011	561	1

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල	ග්‍රාම සේවා වසම් ගණන	ජනගහනය	ජන්ද දායකයින් සංඛ්‍යාව	නගර සභා සංඛ්‍යාව	මහනගර සභා සංඛ්‍යාව	ප්‍රාදේශීය සභා ගණන	මන්ත්‍රී ආසන සංඛ්‍යාව	පළාත් සභා මන්ත්‍රී සංඛ්‍යාව	ජනතාවගේ ජීවනෝපාය/වෙළඳ රටාව	කාර්යමණ්ඩලය		සංචාරක බංගලා/නිවාඩු නිකේතන ගණන
											අනුමත	සත්‍ය	
14.කිලිනොච්චිය	4	95	131462	75465	3	0	0	1	4	කෘෂිකර්මය,ධීවර කර්මාන්තය සහ ව්‍යාපාර කටයුතු	434	208	0
15. රත්නපුරය	17	575	2316761	795759	2	1	14	8	27	වී ගොවිතැන,තේ වගාව, සුළු අපනයන භෝග හා මැණික් කර්මාන්තය	1430	1136	නැත
16.කොළඹ	13	557	2309809	1552733	13	0	0	16	28	වෙළඳාම	63	56	නැත
17.ගාල්ල	16	896	1058771	809882	2	1	17	10	23	ප්‍රධාන ජීවනෝපායන් තේ, රබර්, පොල්, කුරුඳු යන බෝග වගාවන් ආශ්‍රිතතව සහ ධීවර කර්මාන්තය සමඟ සම්බන්ධ වී ඇත	1730	1417	2
18.බදුල්ල	15	567	815000	699066	1	2	15	9	22	දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් 52% ශ්‍රම බලකාය වේ.ඉන් 96% සේවා නියුක්තය.ඉන් 65%කෘෂි කර්මාන්තයට අයත්ය.	1250	1027	6
19.පොළොන්නරුව	7	295	403437	303192	0	0	7	3	11	ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තයයි.	712	492	1
20.අම්පාර	19	503	648057	456942	1	2	17	7	3	කෘෂිකර්මාන්තය,ධීවර කර්මාන්තය,රාජ්‍ය නිලධාරීන්	1377	1156	2
21.අනුරාධපුර	22	649	856232	616903	0	1	18	9	22	කෘෂිකර්මාන්තය,සුළු හා මධ්‍ය පරිමාණ වෙළඳාම, ස්වයංරැකියා	564	471	1
22.හම්බන්තොට	12	576	598567	448277	1	1	10	7	14	කෘෂිකර්මාන්තය,ධීවර කර්මාන්තය	508	593	1
23.පුත්තලම	16	548	759720	526408	2	0	10	8	17	ධීවර,කෘෂි,ඉස්සන් වගාව,කරවල නිෂ්පාදනය,එළවළු වගාව,පළතුරු වගාව,සිමෙන්ති කර්මාන්තය,සංචාරක ව්‍යාපාරය.	1242	958	2
24.ගම්පහ	13	1177	2294641	1590076	5	2	12	18	40	ප්‍රධාන වශයෙන් කර්මාන්ත හා සේවා	97	72	නැත
25.නුවරඑළිය	5	491	706588	520767	1	2	5	8	16	වැවිලි කර්මාන්ත ආශ්‍රිත රැකියා හා කෘෂි කර්මාන්තය	37	29	3

දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් සිදුකරන සංවර්ධන ව්‍යාපෘති - 2013

දිස්ත්‍රික්කය	විමධ්‍යගත අය වැය යටතේ සිදුකරන සංවර්ධන ව්‍යාපෘති				ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ සිදුකරන ව්‍යාපෘති			අනිකුත් ව්‍යාපෘති		
	සංවර්ධන වැඩසටහන		සංඛ්‍යාව	වටිනාකම රු:	සංඛ්‍යාව	වටිනාකම රු:		සංඛ්‍යාව	වටිනාකම රු:	
						ප්‍රතිපාදන	වියදම		ප්‍රතිපාදන	වියදම
01.කුරුණෑගල	1	පන්නල	3	20,000,000	8	3,395,233,825	7,089,059,667	නැත	0	0
	2	කුලියාපිටිය බටහිර								
	3	දිස්ත්‍රික් ලේකම් අතිරේක								
02.වව්නි්ාව	නැත		නැත	0	නැත	0	0	නැත	0	0
03.මාතර	නැත		නැත	0	4	0	738,082,350	1	0	247,000
04.මන්නාරම	නැත		නැත	0	නැත	0	0	2	0	0
05.කළුතර	නැත		නැත	-	නැත	-	-	නැත	-	-
06.මුලතිවු	නැත		168	110,070,000	43	0	1,046,620,000	නැත	0	0
07.යාපනය	1	විමධ්‍යගත 2013	7	1,211,011,275	34	4,333,008,614	4,271,576,186	7	27,393,460,000	17,110,017,000
	2	දිවි නැගුම 2013								
	3	දිවි නැගුම - ගෘහ කර්මාන්ත 2013								
	4	ප්‍රථමික පාසල් 5000								
	5	ශ්‍රී ලංකා ඉන්දියා නිවාස වැඩසටහන								
	6	ලෝක ආහාර වැඩසටහන								
	7	නැවත පදිංචි කිරීමේ වැඩසටහන								
08.කෑගල්ල	1	නිල නිවාසයක් ඉදිකිරීම	2	24,965,727	6	83,960,000	63,901,000	1	43,875,000	28,576,000
	2	පැරණි ගොඩනැගිලි 1 අදියර								
09.මාතලේ	නැත		1603	243,414,065	90	0	18,994,187	8	0	0
10.මහනුවර	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉදිකිරීම්		37	59,686,073	23	532,645,569	495,553,424	නැත	0	0
	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉදිකිරීම්									
	හා වැඩිදියුණුව									
	නිල නිවාස අළුත්වැඩියාව හා වැඩිදියුණුව									
11.මඩකලපුව	ගොඩනැගිලි සහ ඉදිකිරීම්		766	962,480,396	780	121,518,000	112,682,000	1	දැයට කිරුළ ව්‍යාපෘතිය	
	1	කාර්යාල ගොඩනැගිල්ල MP								
	2	කාර්යාල ගොඩනැගිල්ල MW								
	3	නිල නිවාස - සුළු සේවකයන්								
	4	නිල නිවාස - කාර්යාල සේවකයන්								
	දැයට කිරුළ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන									

දිස්ත්‍රික්කය	විමධ්‍යගත අය වැය යටතේ සිදුකරන සංවර්ධන ව්‍යාපෘති			ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ සිදුකරන ව්‍යාපෘති			අනිකුත් ව්‍යාපෘති		
	සංවර්ධන වැඩසටහන	සංඛ්‍යාව	වටිනාකම රු:	සංඛ්‍යාව	වටිනාකම රු: ප්‍රතිපාදන	වටිනාකම රු: වියදම	සංඛ්‍යාව	වටිනාකම රු: ප්‍රතිපාදන	වටිනාකම රු: වියදම
12.මොණරාගල	ගම නැගුම	71	39,136,614	3	10,463,218	7,899,298	18	0	0
	දිවි නැගුම (ප්‍රතිලාභීන්)	63800	16,473,748						
	විමධ්‍යගත	295	25,586,744						
	ප්‍රථමික පාසල්	37	18,309,376						
	පළාත් මාර්ග කාපට් කිරීම	16	1,122,334,906						
	පුබුදුමු වෙල්ලස්ස	2	7,601,267						
	එකතුව	64221	1,229,442,655						
13.ත්‍රිකුණාමලය	නැත	217	662,000,000	327	141,202,968		නැත	0	0
14.කිලිනොච්චිය	නැත	944	510,125,000	22	Capital 70,661,229 Recurrent 49,522,590	Capital 57,347,202 Recurrent 45,784,310	30	0	0
15. රත්නපුරය	මැතිවරණ කොට්ඨාශ මට්ටමින් මාර්ග කාපට් කිරීම. (රත්නපුර, ඇහැළියගොඩ, නිවිතිගල, කලවාන, කොලොන්න, රක්වාන, පැල්මඩුල්ල, බලංගොඩ)	52	2,252,765,365	684	0	56,227,500	අධ්‍යාත්මික සංවර්ධන හා සමාජ සංවර්ධන වැඩසටහන, ආපදා සහන සේවා වැඩසටහන		
16.කොළඹ	විමධ්‍යගත	1050	117,662,100	116	0	199,770,463	නැත	0	0
	ගම නැගුම	60	43,737,980						
	පාසල් ව්‍යාපෘති	97	48,299,931						
	පළාත් මාර්ග කාපට් කිරීම	103	1,806,789,000						
	දිවි නැගුම								
	1 පැල බෙදාදීම		4,946,775						
	2 බීජ පැකට් කිරීම		93,595						
	3 සුළු අපනයන බෝග		428,626						
	4 ස්ථිර බෝග		268,575						
	5 කුකුල් පාලනය		1,197,300						
	එකතුව		6,934,871						
	දිළිදුකමින් තොර වැඩසටහන්	954	9,428,324						
	එකතුව		2,032,852,206						

දිස්ත්‍රික්කය	විමධ්‍යගත අය වැය යටතේ සිදුකරන සංවර්ධන ව්‍යාපෘති			ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ සිදුකරන ව්‍යාපෘති			අනිකුත් ව්‍යාපෘති		
	සංවර්ධන වැඩසටහන	සංඛ්‍යාව	වටිනාකම රු:	සංඛ්‍යාව	වටිනාකම රු: ප්‍රතිපාදන	වියදම්	සංඛ්‍යාව	වටිනාකම රු: ප්‍රතිපාදන	වියදම්
17.ගාල්ල	ආරක්ෂිත බැම්ම ප්‍රා.ලේ.කා - ඉමදුව		6,394,435	5	0	1,281,749,557	4	0	2,650,209
	ආරක්ෂිත බැම්ම අති.දි.ලේ. නිල නිවස		1,480,380						
	පෝද්දල		3,100,512						
